නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණෝ -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- ආෂූරා දිනයේ උපවාසයේ නිරත වූහ.

ඉබ්නු අබ්බාස් -රළියල්ලාහු අන්හුමා- තුමා විසින් වාර්තා කරන ලදී. “නියත වශයෙන්ම අල්ලාහ්ගේ දූතයාණෝ -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- ආෂූරා දිනයේ උපවාසයේ නිරත වූහ.එසේ උපවාසයේ නිරත වන මෙන් නියෝග ද කළහ. [පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

සැබැවින්ම ආෂූරා උපවාසය සුන්නාවක් යන්න සියලු විද්වතුන්ගේ ඒකමතික තීන්දුවයි. එය අනිවාර්යය නොවන්නේය. ඉස්ලාමය මුල් කාලයේ රමළාන් උපවාසයට පෙර එය ආගමානුගත කළ අවස්ථාවේ එම උපවාසය අනිවාර්යද නැද්ද යන්නෙහි නීතිය පිළිබඳව මතභේද තිබිණ. ඒ අනුව එය අනිවාර්යය යැයි සිතූ උදවිය මෙම ප්රකාශය තක්සේරු කළහ. එහි අනිවාර්යය භාවය තවත් සහීහ් හදීස් මාර්ගයන්ගෙන් වෙනස් කරන ලදී. ඒවායින් එක් හදීසයක් ආඉෂා -රළියල්ලාහු අන්හා- තුමිය විසින් වාර්තා කරන ලද හදීසයකි. එනම්: කුරෙය්ෂ්වරු ජාහිලිය්යා නම් අඥාන යුගයේ ආෂූරා දිනයෙහි උපවාසයේ නිරත වූහ පසුව අල්ලාහ්ගේ දූතයාණන්ද රමළානයේ උපවාසය අනිවාර්යය කරන තෙක්ම උපවාසයේ නිරත වන මෙන් නියෝග කළහ. පසුව අල්ලාහ්ගේ දූතයාණෝ මෙසේ ප්රකාශ කළහ. කවරෙකු කැමැත්තේද ඔහු උපවාසය රකිත්වා. කවරෙකු කැමැත්තේද ඔහු උපවාසයෙන් මිදෙත්වා මෙය ඉමාම් බුහාරි තුමා එතුමාගේ සහීහ් ග්රන්ථයේ (3/24 අංක 1893) සඳහන් කොට ඇති අතර ඉමාම් මුස්ලිම් තුමා එතුමාගේ සහීහ් ග්රන්ථයේ (2/792 අංක 1125) හි දන්වා ඇත.

http://www.sunnah.global/hadeeth/si/show/10121